## ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව - 2018

-----------------------------------------------------------------

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, කොමිෂන් සභාවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, කොමිෂන් සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය කොමිෂන් සභාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා කොමිෂන් සභාව අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

කොමිෂන් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, කොමිෂන් සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ කොමිෂන් සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති,

පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ කොමිෂන් සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, කොමිෂන් සභාවක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 01;** | | |
| (i) ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත් ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශයෙන් සංසන්දනාත්මක තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි. | සංසන්දනාත්මක තොරතුරු 2019 වර්ෂයේදී ඉදිරිපත් කිරීමට සටහන් කර ගන්නා ලදී. | ප්‍රමිතියේ අවශ්‍යතාවයන් අනුව කටයුතු කිරීම. |
| (ii) 129 (ඇ) (ii) ඡේදය ප්‍රකාරව මූල්‍ය නොවන හෙළිදරව් කිරීම් යටතේ හෙළිදරව් කළ යුතු මූල්‍ය අවදානම හා මූල්‍ය අවදානම් කළමනාකරණය පිළිබඳව තොරතුරු හෙළිදරව් කර නොතිබුණි. | 2019 මූල්‍ය වර්ෂයේදී අවදානම් තක්සේරුව වෙනමම කොටසක් ලෙස ඇතුළත් කිරීමට හා ගිණුම්කරණ ප්‍රතිපත්ති වෙනස් කිරීමට කටයුතු කරනු ලැබේ | ප්‍රමිතියේ අවශ්‍යතාවයන් අනුව කටයුතු කිරීම. |
| **(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති අංක 02 ;** | | |
| (i) ස්ථාවර තැන්පත් වල ආයෝජනය තුළින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය හා ප්‍රති මිලදී ගැනුම් තුලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුලින් වෙන් වෙන් වශයෙන් හෙළිදරව් කර නොතිබුණි. | ප්‍රමිත අංක 2 (32) උප වගන්තිය යටතේ වක්‍ර ක්‍රමයට මුදල් ප්‍රවාහ ප්‍රකාශ ශුද්ධ අගයට ගලපා පිළියෙල කරනු ලැබේ. ආයෝජනය කිරීම තුළින් මුදල් ගලා ඒම සහ ගලා යෑමේ ශුද්ධ අගය (රු. 40,000,000/-) ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශයට ගලපා ඇත. | ප්‍රමිතියේ අවශ්‍යතාවයන් අනුව කටයුතු කිරීම. |
| (ii) මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කිරීමේදී බදු පෙර ලාභය මත | 2019 වසරේදී නිවැරදි කිරීමට සටහන් කර ගන්නා ලදී. | ප්‍රමිතියේ අවශ්‍යතාවයන් |

| | | |
|---|---|---|
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය ගණනය කළයුත වුවත් බදු පසු ලාභය මත මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය ගණනය කර තිබුණු බව නිරීක්ෂණය විය. | | අනුව කටයුතු කිරීම. |
| **(ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති අංක 07 ;** | | |
| (i) 90 ඡේදය ප්‍රකාරව දේපල හා පිරියත උපකරණ පන්තියක ප්‍රත්‍යාගණිත අගයන්ට ප්‍රකාශ කර ඇති විට අස්ථිත්වය ප්‍රත්‍යාගණිත අගයන්ට අදාලව හෙළිදරව් කිරීම් කල යුතු වුවත් එපරිදි කටයුතු කර නොතිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | ප්‍රමිතියේ අවශ්‍යතාවයන් අනුව කටයුතු කිරීම. |
| (ii) 07 ඡේදය අනුව වත්කම්වල ඵලදායී ජීව කාලය වාර්ෂිකව නැවත පරීක්ෂා කිරීම සිදුකර ඒ අනුව ඇතිවන ගැලපීම් රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති අංක 03 ට අනුව කල යුතු වූ නමුත් පූර්ණ ලෙස ක්ෂය වී ඇති රු. 36,332,454 ක් වූ වත්කම් සම්බන්ධයෙන් එපරිදි කටයුතු කර නොතිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | ප්‍රමිතියේ අවශ්‍යතාවයන් අනුව කටයුතු කිරීම. |

### 1.5.2 අධිකාරී බලය නොලත් ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| අධිකාරී බලය නොලත් ගනුදෙනු පිළිබඳ විස්තරය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කොමිෂන් සභාවේ වැටුප් අනුමත වැටුප් පරිමාණ හා දැනට ගෙවනු ලබන තත්‍ය වැටුප් පරිමාණ අතර වෙනස්කම් නිරීක්ෂණය විය. ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව හා රේඛීය අමාත්‍යාංශය විසින් වැටුප් වැඩි කිරීම නිර්දේශ කළ නොහැකි බව දන්වා තිබියදීත් 2012 වර්ෂයේ මණ්ඩලයේ භාණ්ඩාගාර නියෝජිත (Treasury Representative) විසින් නිකුත් කර තිබූ ලිපියක් මත මූලික වැටුපෙන් සියයට 25 ක වැටුප් පරිමාණය වැඩිකර ගෙන ගෙවා තිබුණු බව නිරීක්ෂණය විය. | රක්ෂණ නියාමන කොමිෂන් සභාව අනෙකුත් නියාමන කොමිෂන් සභා හා සාපේක්ෂව ස්ථාපනය කරන ලද පනත් වල ප්‍රතිපාදන වලට අනුකූලව කටයුතු කරනු ලැබේ. ඒ අනුව, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ වැටුප් හා වේතන 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරිමේ පනත මගින් ලැබී ඇති බලතල අනුව වැටුප් තීරණය කර ඇත. | වැටුප් වැඩි කිරීමට පෙර ඒ සඳහා විධිමත් පරිදි අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළ යුතුවේ. අනුමැතියකින් තොරව සිදු කල ගෙවීම් වගකිවයුතු නිලධාරීන්ගෙන් අයකර ගැනීමට කටයුතු කල යුතුය. |

### 1.5.3 අවිනිශ්චිත ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විෂයය | මුදල<br>රු. | අවිනිශ්චිත ලෙස තිබූ කාලය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| ලාභාලාභ අවිනිශ්චිත ගිණුම | රු.31,150 ක ආරම්භක හර ශේෂයක් හා රු.192,578,152 ක අවසාන හර ශේෂය | ගිණුම් මෘදුකාංගය (DMS) මගින් ලබා ගත් ශේෂ පිරික්සුම (Trial Balance) තුළ ලාභාලාභ අවිනිශ්චිත ගිණුමක් (P&L Suspense Account) නිරීක්ෂණය වූ අතර, එහි රු.31,150 ක ආරම්භක හර ශේෂයක් හා රු.192,578,152 ක අවසාන හර ශේෂයක් පැවතීම හේතුවෙන් ගිණුම් තැබීමේ නිරවද්‍යතාවය පිළිබඳව විගණනයට සෑහීමට පත්විය නොහැකි වූ අතර මෙම දෝෂය හඳුනාගෙන නිවැරදි කිරීමට කටයුතු කර නොතිබිණි. | රක්ෂණ නියාමන කොමිෂන් සභාව භාවිතා කරන DMS මෘදුකාංගයේ 2018 වසරට අදාල ගිණුම් පියවා නොතිබුණු බැවින් ලාභ අලාභ අවිනිශ්චිත ගිණුමෙහි ශේෂයක් පැවතුණි. අවසාන ගිණුම් පියවීමෙන් පසු එම ගිණුම ශුන්‍ය අගයක් ගනු ලැබේ. | සියළුම ගිණුම් පියවීමෙන් පසුව එම ශේෂ පදහම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |

### 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 371 රෙගුලාසිය | ලබා ගන්නා තත්කාර්ය අතුරු අග්‍රිම එය දෙන ලද කාර්යය නිම කළ වහාම නැවත පියවිය යුතු වුවත් 2016, 2017, 2018 වර්ෂයන්හිදී නිකුත් කරන ලද රු.554,497 ක් වූ අත්තිකාරම් 03 ක් 2019 අප්‍රේල් 30 දින වන විටත් පියවා නොතිබුණි. | මෙම ප්‍රාග්ධන වියදම් සම්බන්ධයෙන් අදාල කාර්යයන් සම්පූර්ණයෙන් නිම වූ පසු 2019 වසරේදී ප්‍රාග්ධනිත කිරීමට බලාපොරොත්තු වේ. | අදාළ ආයතන සමඟ සාකච්ඡා කර ගිවිසුම්ගත වී අවශ්‍ය පරිදි කඩිනමින් කාර්යයන්/ සේවාවන් ලබා ගෙන අත්තිකාරම් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. |
| (ii) 2003 ජුනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.14 ඡේදය | 2019 අප්‍රේල් 30 දින වන විටත් භාණ්ඩාගාර ලේකම්ගේ එකඟතාවය ලැබී නොතිබුණු පරිපාලන අත්පොත ප්‍රකාරවම විවිධ ගෙවීම් සිදු කෙරෙමින් පවතින බව නිරීක්ෂණය විය. | 2018.05.18 දින පැවැති 182 වන කොමිෂන් සභාවේදී පරිපාලන අත්පොතට පරිබාහිරව රාජ්‍ය චක්‍රලේඛ අනුගමනය කිරීමේදී ආයතනයේ කාර්ය නිසිලෙස පවත්වාගෙන යාම දුෂ්කර විය හැකි බවට එකඟ වන ලද අතර දැනට අනුමත පරිපාලන අත්පොත භාවිතා කිරීමට අනුමැතිය ලබාදෙන ලදී. | පරිපාලන අත්පොත විධිමත් පරිදි අනුමත කර ගැනීමට කටයුතු කර අදාල අනුමැතිය මත පමණක් විවිධ ගෙවීම් සිදු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (iii) 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ 48(1) වගන්තිය | කොමිෂන් සභාවේ ජීවගණක තනතුර දිගින් දිගටම පුරප්පාඩුව පැවතීම හේතුවෙන් රක්ෂණකරුවන් විසින් වාර්ෂිකව ඉදිරිපත් කරනු ලබන ජීවගණක වාර්තා 2016 වර්ෂයේ සිට මේ දක්වා සමාලෝචනය කර නොතිබුණු බව නිරීක්ෂණය විය. | ජීවගණකයෙකු නොමැතිවීම හේතුවෙන් මෙම තත්වය උද්ගත වී ඇත. නමුත් 2019 වසරේ සිට මූල්‍ය අංශ නවීකරණ වැඩසටහන (FSMP) තුල ජීවගණකයකු ලබා ගැනීමට මේ වන විටත් කටයුතු කර ඇත. | පනතේ විධිවිධාන පරිදි එම කාර්යයන් සඳහා ජීවගණකවරයෙකුගේ සේවය ලබා ගැනීමට කටයුතු කළ යුතුවේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.41,337,937 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.31,220,674 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 10,117,263 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට ආදායමේ ඉහළ යාම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අනාර්ථික ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කොමිෂන් සභාවේ කාර්යාල කටයුතු බාහිර ආයතනයක පවත්වාගෙන යනු ලබන අතර ගොඩනැගිල්ලෙහි කුලිය ලෙස 2018 වර්ෂයේ දී රු.38,533,202 ක් ගෙවා තිබුණු අතර එය 2017 වර්ෂයට සාපේක්ෂව සියයට 13 ක වර්ධනයක් බව නිරීක්ෂණය විය. ඒ අනුව ගෙවන ලද ගොඩනැගිලි කුලිය මුළු වියදමේ හා මුළු ආදායමේ ප්‍රතිශතයක් ලෙස පිළිවෙලින් 27 ක් හා 21 ක් විය. | නියාමන ආයතනයක් පවත්වා ගෙන යාමට සුදුසු පරිසරයකින් සමන්විත ස්ථානයක් වර්තමාන පිරිවැයට වඩා අඩු මුදලකට සොයා ගැනීමට දරන ලද සියලු උත්සාහයන් ව්‍යර්ථ විය. ඉදිරි වසර 5 සඳහාද කාර්යාල ගොඩනැගිලි කුලිය සාකච්ඡා කොට එකගත්වයකට පැමිණ ඇති අතර කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගෙන ඇත. | ආර්ථිකමය වශයෙන් අඩු වියදම් සහිත ගොඩනැගිලි පහසුකම් ලබා ගැනීමට කටයුතු කිරීම සුදුසු වේ. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ක්‍රියාකාරි සැලැස්ම අනුව රක්ෂණ සමාගම් වල මාසික වාර්තා, කාර්තුමය වාර්තා හා වාර්ෂික වාර්තා කොමිෂන් සභාව වෙත ලැබීමෙන් පසු මාස 02– 03 ඇතුළත සමාලෝචනය කළයුතුය. එසේ වුවද ආයතන 04 ක වාර්ෂික වාර්තා සමාලෝචනය කිරීමේදී දින 38 සිට දින 84 දක්වා කාලයක ප්‍රමාදයන් පවතින බව නිරීක්ෂණය විය. | ඇතැම් ප්‍රමාදයන්වලට හේතු වූයේ විශ්ලේෂණයේදී මතු වූ සමහර නිරීක්ෂණ විස්තරාත්මක ලෙස විශ්ලේෂණය කිරීමට සිදු වීම බවට තහවුරු විය.<br>තවද ප්‍රමාදයන් වැලැක්වීම සඳහා අඛණ්ඩව සිහි කැඳවීම් කිරීමටද, සමාලෝචනයන් නිරීක්‍ෂණය කිරීමටද පියවර ගෙන ඇත. | ක්‍රියාකාරි සැලැස්ම අනුව ක්‍රියා කළ යුතුවේ. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කොමිෂන් සභාව 2016 වර්ෂයේ ආරම්භයේ සිට රක්ෂණ සමාගම්වල නුබුන්වත් නීති රාමුව වෙනුවට හඳුන්වාදුන් අවධානම් පාදක ප්‍රාග්ධනය මූලික කරගත් සුපරීක්ෂණ ක්‍රමයකට (RBC) යොමුවීම නිසා ජීවගණක ඒකකයක් ඇති කිරීමට තනතුරු 04 ක් 2016 දෙසැම්බර් වන විට අනුමත කරගෙන තිබුණි. එසේ වුවද එම තනතුරු 2019 අප්‍රේල් 30 දින වන විටත් පුරප්පාඩුව පැවතුණි. | දැනට පුරප්පාඩුපාඩුව පවතින ජීවගණක සහ සහකාර ජීවගණක තනතුරු සඳහා කොමිෂම මගින් ක්‍රියාත්මක කරන ලෝක බැංකු ව්‍යාපෘතිය ක්‍රියාත්මක වීමත් සමඟ බඳවා ගැනීම් සිදු කිරීමට බලාපොරොත්තු වේ. | කොමිෂන් සභාවේ කාර්යසාධනයට බලපෑමක් විය හැකි බැවින් කාර්ය මණ්ඩල පුරප්පාඩු කඩිනමින් පිරවිය යුතුවේ. |

# 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

## 4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (i) ගිණුම් වර්ෂය අවසාන දිනට ගිණුම් පියවා ගණුදෙනු අවසන් කළයුතු වුවද, විගණිත දිනය වූ 2019මාර්තු 25 දින වන විටත් පරිගණක ගිණුම් පද්ධතිය පියවා ගණුදෙනු සටහන් කිරීම අවසන් කර නොතිබුණි. | රක්ෂණ නියාමන කොමිෂන් සභාව භාවිතා කරන DMS මෘදුකාංගයේ 2018 වසරට අදාල ගිණුම් පියවා නොතිබුණු බැවින් ලාභ අලාභ අවිනිශ්චිත ගිණුමෙහි ශේෂයක් පැවතුණි. අවසාන ගිණුම් පියවීමෙන් පසු එම ගිණුම ශූන්‍ය අගයක් ගනු ලැබේ. | විගණනය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන අවස්ථාව වන විට සියළුම ගිණුම් පියවා තිබිය යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| (ii) | ආයතනයට ලැබී තිබුණු එකතුව රු.1,569,187 ක් වටිනා ස්ථාවර වත්කම් 02 ක් හා 2019 වර්ෂයේ දී කොමිෂන් සභාව විසින් අත්පත්කර ගෙන තිබුණු රු.319,890 ක් වටිනා ස්ථාවර වත්කම් සමාලෝචිත වර්ෂයේ ජංගම වත්කම් අත්පත් කරගැනීමක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | 2018 වර්ෂයට වියදමක් වන බැවින් උපචිත වියදම් ගිණුමට නිවැරදි ලෙස සටහන් කර ඇත.<br><br>2019 වසරේ වත්කම් නියමිත ප්‍රමිතීන්ට අනුකූල විය යුතු අතර එසේ තහවුරු කර ගැනීමෙන් පසු එය වත්කමක් ලෙස ගිණුම් ගත කරනු ලැබේ.<br><br>අදාල ප්‍රතිපාදන වෙන් කිරීම හා ඇණවුම් කිරීම සිදු කර ඇත්තේ 2018 වසරේදීය. 2018 වර්ෂයට අදාල උපචිත වියදම් ලෙස සටහන් කර ඇති අතර 2019 වසරේදී අදාල වත්කම් ආයතනය වෙත ලැබුණු පසු වත්කම් ගිණුමට නිවැරදිව ගිණුම්ගත කර ඇත. | ජංගම වත්කම් හා ස්ථාවර වත්කම් විධිමත් පරිදි හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුවේ. |
| (iii) | වායු සමීකරණ පද්ධතිය සඳහා ගෙවිය යුතු රු.200,000 ක උපදේශන ගාස්තු කෙරීගෙන යන වැඩ ලෙස ගිණුම්ගත නොකර ජංගම වත්කමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | එම වත්කම් නිසියාකාර තත්වයේ පවතින බව තහවුරු වූයේ 2019 වසරේදීය. ඒ අනුව, එම තහවුරු කිරීමට පසු අදාල වත්කම 2019 දී වත්කම්, ගිණුමට මාරු කරන ලදි. | වියදම් නිසි ලෙස වර්ගීකරණය කර දැක්විය යුතුවේ. |

**4.2 තිරසාර සංවර්ධන අරමුණු**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාළව ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොවුණි | තිරසර සංවර්ධන අරමුණු ලඟා කර ගැනීම උදෙසා ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවට අදාල විෂය පථය සමබන්ධයෙන් මුදල් අමාත්‍යාංශයේ උපදේශකත්වය බලාපොරොත්තු වේ. | තිරසර සංවර්ධනය සම්බන්යෙන් කටයුතු කළ යුතුවේ. |